# සිමෙන්ති මල් පොච්චි නිෂ්පාදනය

**අවශ්‍ය අමුද්‍රව්‍ය**

1/16'' දැලකින් හලා ගන්නා ලද වැලි

පොට්ලන්ඩ් සිමෙන්ති

ජලය

**නිෂ්පාදන ක්‍රියාවලිය**

- වැලි සහ සිමෙන්ති පරිමාව අනුව 8 ඃ 1 අනුපාතයට මිශ්‍ර කර වියලි මිශ්‍රණය තුනී කරන්න.
- ඒ මතට ජලය ඉස මිශ්‍රණය හොඳින් අනාගන්න.
- ඉන්පසු මෙම තෙත් මිශ්‍රණය අච්චුව තුල 3/4'' - 1'' පමණ ඝනකමට අතුරා ගන්න.
- මෙම අවස්ථාවේදී ලී කැටයක (රූප සටහන බලන්න) ආධාරයෙන් පොච්චියේ බිත්ති තෙරපීම කල යුතුයි.
- ඉන්පසු පෝච්චිය වැලිවලින් පුරවා ලෑල්ලක් මත මුනින් අතට හරවා තබන්න.
- එවේලේහිම සිමෙන්ති පෝච්චිය අච්චුවෙන් මුදා ගන්න.
- පදම් කිරීමෙන් පසු පින්සලක ආධාරයෙන් පෝච්චියේ පිටත පෘෂ්ඨය සිමෙන්ති දියරයෙන් ආලේප කිරීමෙන් හොඳ නිමාවක් ලබාගත හැකිය.

**පදම් කිරීම**

අවම වශයෙන් දින 07ක් තිස්සේ දිනකට තෙවරක් පමණ වතුර ඉසින්න.

**උපකරණ**

පෙනේර

සවල

තාච්චි

අත්වැසුම් 1- 2

පින්සල්

මල් පෝච්චියේ බිත්ති තෙරපීම සඳහා ලී කැටයක්

අච්චු

**මිශ්‍රණය**

සිමෙන්ති ඃ වැලි 1 ඃ 8

**සටහන**

මෙවැනි නිෂ්පාදනයකදී සිමෙන්ති / වැලි මිශ්‍රණය සදහා යොදාගන්නා ජලය ප්‍රමාණය පාලනය කරගත යුතුයි. සාමාන්‍ය බදාම මෙන් නොව අවම ජලය ප්‍රමාණයක් මිශ්‍රණය සදහා යොදාගන්න.

**ජල ප්‍රමාණය වැඩිවීමෙන්**

- භාණ්ඩයේ ශක්තිය හීනවීම හා සිමෙන්ති මිශ්‍රණය අච්චු තුල ඉදි කර ගැනීමේ අපහසුතාවක් ඇති වේ.

- මල් පෝච්චිය පතුලේ සිදුරක් සාදාගැනීම අච්චුවෙන් වෙන් කල

- අවස්ථාවේදීම කල යුතුය.

## අච්චුව

- මෙය තමන්ට අවශ්‍ය පරිදි ලීයෙන් හෝ සිමෙන්තියෙන් සාදා ගත හැකිය. (රූපය 1 බලන්න)

- විශේෂ මෝස්තර සහිත භාණ්ඩ තැනීමේදී මෙම අච්චු තහඩු වලින් හෝ ලීයෙන් තනා ගන්නා අතර එය පලු දෙකකින් හෝ වැඩි ගණනකින් සමන්විතවේ. මෙහි මාන වෙනස් විය හැක.

- ලී හෝ තහඩු භාවිතා කොට පෝච්චි සෑදීම

- මේවා කොටස් දෙකකින් හෝ කිහිපයකින් යුක්තයි.

- ඒවා පිටත අච්චුව සහ ඇතුලත අච්චුව වේ.

- බදාම දැමීමට ප්‍රථම අවශ්‍යතාවය මත ලිහිස්සුම් කාරකයක් (උදා- මිනිරන් කුඩු) අච්චුවේ පැතිවල ආලේප කරන්න

- පලමුව පෝච්චියේ පතුල නිම කර ගන්න

- ඉන්පසු වැලිවලින් පෝච්චිය පුරවා මුනින් අතට හරවන්න

- ඉන්පසු අච්චුවේ පලු එකින් එක ඉවත් කරන්න

- ඉහත සදහන් ආකාරයටම වේලීම සහ පදම් කිරීම කරන්න

- භාණ්ඩය නිමකොට ටික වේලාවකින් අච්චුවෙන් භාණ්ඩය මුදා ගත හැක

## අච්චුව

රූපය 1.




රූපය 2






රූපය 3